**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** - **සභාපතිගේ පුද්ගලික සහකාර**

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර අධ්‍යයනය/ ව්‍යාපාර කළමනාකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය/ රාජ්‍ය කළමනාකරණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම විෂයක ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්.

**වැටුප් පරිමාණය** - රු. 62,310/-, 10X1,360/-, 15X1,670/-, 5X2,040/-=111,160/- (MA 5-2-2025- ශ්‍රේණිය II) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු. 56,899/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

**වයස** - ඉහත තනතුර සඳහා වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**තනතුර** - **අභ්‍යන්තර විගණක**

**සුදුසුකම්** - **(අ) බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය/ මූල්‍ය කළමනාකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම විෂයක ප්‍රථම උපාධියක්

   සහ

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව තනතුරුට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත් වීම.

   සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් (පහළ 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් ලබා තිබීම.
2. ශ්‍රී ලංකා රජ්‍ය වැවිලි සංස්ථාවේ, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකාර (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් පරිමාණය** - රු. 91,690/-, 10X2,480/-, 15X3,450/-=168,.240/-(MM 1-1-2025- ශ්‍රේණිය II) (මාසිකව) + රජයේ අනුමත දීමනා

**මූලික වැටුප් පියවර** - රු.81,710/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛනය ii ප්‍රකාරව)

**බඳවා ගැනීමේ ක්‍රමය** - පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | | |
|---|---|---|
| ● අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| ● අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 30 |
| ● අනෙකුත් ජයග්‍රහණ | - | ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

**වයස** - අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වෙනත්** - මෙම වර්ගීකරණය සඳහා වන සියලු බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

**අමතර ප්‍රතිලාභ** - නේවාසික හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පහසුකම්

සේවක අර්ථසාධක අරමුදලට හෝ වැවිලි කරුවන්ගේ අර්ථසාධක සංගමයට තම වැටුපෙන් අවම වශයෙන් 10%ක දායකත්වයක් ලබාදිය යුතු අතර, අර්ථසාධක අරමුදල සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ දායකත්වය වැටුපෙන් 12%ක් වන අතර, සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය 3%ක් වේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් විසින් සියලු විස්තර සහිත ස්වකීය අයදුම්පත්, උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සහතිවල පිටපත් සමග කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය.

රජයේ / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා යොමු කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය** - 2026 මාර්තු 13 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**